# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1817/64 - 2013 ජූලි මස 05 වැනි සිකුරාදා - 2013.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය:04/03/01/09.

ඉඩම් අමාත්‍යාංශයේ අංකය: එල්ඩී/05/2010/ඩබ්ලිව්එස්/272

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

**ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 815 බී පහලගොඩ ග්‍රාම නිලධාරී වසමේ, පහලගොඩ ගමේ පිහිටි ස.ජ.ගේ පිඹුරු අංක මු.පි.ක. 4393 හි කැබලි අංක 01, 02, 03 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3379 ක්වූ කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය නමැති ඉඩම

01. කැබලි අංක 01

ඉඩමේ නම: කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය; හිමිකම් කියන්නන්: මු.පි.ඒ. 889 හි 12 කැබැල්ලේ කොටසක්; මුල් හිමිකම්පාන්නා සොයා ගත නොහැක. නාහල්ල, පහලගොඩ පදිංචි ප්‍රේමරත්න විතාන බුක්ති විඳී; ප්‍රමාණය: හෙක්. 0.1919.

02. කැබලි අංක 02

ඉඩමේ නම: කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය; හිමිකම් කියන්නන්: කුඩා ගඟෙහි කොටසක්; ප්‍රමාණය: හෙක්. 0.010.

03. කැබලි අංක 03

ඉඩමේ නම: කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය; හිමිකම් කියන්නන්: මු.පි.ඒ. 889 හි 11, 12, 13, 16, 17, 18, 21, 22, 23, 24 වැනි බිම් කැබලිවල කොටස්, අංක නොයෙදූ ගම් සහා පාරෙහි කොටසක්, මුල් හිමිකම්පාන්නා සොයා ගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.1353.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2013 සැප්තැම්බර් 02 දින පූ.භා. 10.00ට මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතු යි.

තව ද, 2013 අගෝස්තු 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

මේනකා ප්‍රියන්තා අබේරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මදුරාවල.

2013 ජූලි මස 03 වැනි දින,
මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 599


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A-G 017928 - 315 (2013/07)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*